**බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය**

7 ශ්‍රේණිය - 2 වාරය - නර්තනය

## සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය උපකරණ යොදාගනිමින් තේමාවකට අනුව වාදනය කරමු.

- සමූහ වාදනයක් නිර්මාණය කිරීම සඳහා සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩ යොදාගත හැකිය
- ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය, රබාන, බුම්මැඩිය ආදී සාම්පදායික වාද්‍ය භාණ්ඩ යොදාගත හැකිය.
- එසේම මෙම භාණ්ඩ අතරට විකල්ප වාද්‍ය භාණ්ඩද යොදාගත යුතුය.
- මෙසේ ශබ්ද හා නාද නිපදවන ආකාරය අපි විමසා බලමු.

උදා- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක් වන ගැටබෙරය මෙන්ම ඒ හා හඬ නිපදවිය හැකි ටින් බෙරයක් හා දඬු බෙරයක් යොදාගත හැකිය.

### වාදනය කළ හැකි පද

**1. කුඳ ගත ගත දොං**

**2. කුඳට ගතට කුඳට ගජිං**

**3. කුඳ කුඳ කුඳ තකට තකට**

ඉහත ආකාරයට බෙර පද වාදනය කළ හැකි අතර වාදන භාණ්ඩ මාරු කරමින් ද බෙර පද වාදනය තළ හැකිය.

කුඳ - ගැටබෙරය ගත - දඬු බෙරය ගත - දඬු බෙරය දොං - ගැටබෙරය
කුඳට - ගැටබෙරය ගතට - ටින් බෙරය කුඳට - දවුල ගජිං - ගැටබෙරය හා දඬු බෙරය

මීට අමතරව සියලුම භාණ්ඩ උපයෝගී කර ගනිමින් තේමාවකට අනුව ද වාදනයන් නිර්මාණය කළ හැකිය.

Balangoda Zonal Education

1. පෙරහැර - කස හඬ, හේවිසි හඬ, ලී කෙළි නැටුම.........
2. කෝච්චියක් ගමන් කරන ආකාරය

1. විකල්ප වාද්‍ය භාණ්ඩයක් නිර්මාණය කර විවිධ බෙර පද හා නාද වාදනය කරන්න.
2. විකල්ප වාද්‍ය භාණ්ඩ හා සාම්ප්‍රදායික වාදන භාණ්ඩ වාදනය වන අවස්ථා නරඹා රස විඳින්න.

සැකසුම ඃ සිතාරා පවිත්‍රානි මිය
ර/ විද්‍යාකර මහා විද්‍යාලය

Balangoda Zonal Educ